
# හඳ මාමා සහ හංසි බබා



වෙනිරු අභිශාක්‍යා දිසානායක

# හඳ මාමා
# සහ හංසි බබා

**වෙනිරු අභිශාක්‍යා**

පළමු දිගහැරීම

මහමායා බාලිකා මහා විද්‍යාලය
1 ශ්‍රේණිය E
2025-02-08

ISBN 978-624-208-664-4

# පිදුම

මා මෙලොවට බිහි කොට
ඒ දිනයේ සිට මේ දක්වා
මේ විෂම වූ සමාජයේ
මැනවින් පියමනින්නට,
මට සවිය දුන්,
මාගේ දයාබර දෙමාපියන්ටත්
අප සැමට දැනුම ලබා දෙමින්
අපව පෝෂණය කොට
දැනුමෙන් අභියෝගවලට මුහුණ දීමට
අපහට කියා දෙන අපගේ
දයාබර ගුරු මෑණිවරුන්ටත්
දයාබර ගුරු පියවරුන්ටත්
පුදමි මෙය හරසරින් .........

## පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක රටක ලස්සන ගම්මානයක් තිබුණා, මේ ගම්මානයේ මැද ලස්සන පුංචි ගෙයක් තිබුණා. ඒ ගෙදර පුංචි පවුලක් ජීවත් වුණා.



ඒ පුංචි පවුලේ අක්කා කෙනෙකුයි නංගි කෙනෙකුයි හිටියා. අක්කගේ නම මලී, නංගිගේ නම හංසි.




නංගි හරිම කරුණාවන්තයි, සතුන්ට ගොඩක් ආදරෙයි, ගෙදර වැඩිහිටි හැමෝටම කීකරුයි. ඒ නිසා හංසිට අනිත් අයත් ගොඩාක් ආදරෙයි.

අක්කා නම් හරිම නපුරුයි, සතුන්ට හරියට හිරිහැර කරනවා. වැඩිහිටියන්ට අකීකරුයි, ඒ වගේම නංගිත් එක්කයි, යාළුවොත් එක්කයි හරියට දබර කරගන්නවා. මේ නිසා අක්කාට කවුරුත් ආදරේ නම් නෑ.



ඔන්න දවසක් හඳ මාමා රෑට එබිලා බලන්න පටන් ගත්තා.

හඳ මාමා දැක්කා හංසි බබාව. මෙයාගේ හොඳ ගතිගුණ දැකලා හඳ මාමා හොඳටම සතුටු වුණා.



හඳ මාමා කිරියි, පැණියි අරන් හංසි බබාගේ කාමරය ගාවට ආවා. හංසි බබා හඳ මාමාව දැකලා ගොඩාක් පුදුම වුණා.

හඳමාමා හංසි බබාට රසම රස කිරියි, පැණියි දීලා කීවා,



"මේවා කන්න, මේවා මම දෙන්නේ හොඳ ළමයින්ට විතරයි. මේවා බීපුවාම දවසින් දවස ලස්සන වෙනවා"



ඊට පස්සේ හඳමාමා හංසි බබාව එක්කන් ඈත අහසට පාවෙලා ගිහින් තරු කැට එක්ක සෙල්ලම් කෙරුවා. රෑ අහස හරිම ලස්සනයි. වලාකුළුවල පිනුම් ගැහුවා. හංසි බබා හොඳටම විනෝද වෙනවා. හංසි බබාට හරි ම සතුටුයි. ඊට පස්සේ, හංසි බබාව ආපහු පරිස්සමට කාමරේට බැස්සුවා. හැමදාම රෑට හඳමාමා හංසි බබාව බලන්න ආවා.

හංසි බබා කොච්චර වැඩ කරත් දවසින් දවස ලස්සන වෙනවා. එයාගේ හොඳ ගතිගුණ තවත් වැඩි වුණා. මලී හංසිගේ ලස්සන දවසින් දවස වැඩි වෙනවා දැක්කා. හැමෝම තව තවත් හංසි බබාට ආදරේ වෙනවා දැක්කා. මලීට හොඳටම දුක හිතුනා. මලී ඇහුවා හංසිගෙන්
''කොහොමද ඔයා ඔහොම ලස්සන වුණේ'' කියලා.



හංසි බබා ලෝභ නැතුව හඳ මාමාගේ මුළු විස්තරයම මලීට කිව්වා. මලීත් තදින්ම හිතට ගත්තා,
"අද ඉඳන් හොඳ ළමයෙක් වෙනවා" කියලා.

මලී නරක ගති සේරම අත ඇරියා. ටිකෙන් ටික හැමෝම මලීටත් ආදරේ කරන්න පටන් ගත්තා.



හඳමාමා මලීවත් දැක්කා. හඳමාමාට  හරි ම සතුටුයි.

හඳමාමා දැන් මලීටත් කිරියි පැණියි ගෙනත් දෙනවා.



මලීවයි හංසිවයි අහසට එක්කගෙන යනවා. තරුත් සමඟ සෙල්ලම් කරනවා.

වළාකුළුවල ඔන්චිලි පදිනවා. ඒ ගොල්ලෝ හරියට සතුටු වෙනවා.



මලීත් දැන් හංසි වගේම හරිම ලස්සනයි.

මේ තුන්දෙනා ගොඩක් කල් සතුටින්, විනෝදයෙන් ජීවත් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසනි

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්